# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022**
**2024 ඔක්තෝබර්/ නොවැම්බර්**

**සමාජීය විද්‍යා පීඨය**

## ජනසන්නිවේදනය (නව නිර්දේශය)

## සන්නිවේදන මූලධර්ම MACO 18214

ප්‍රශ්න **පහකට (05)** පමණක් **පිළිතුරු** සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

1. මානව සම්බන්ධතා ගොඩ නගමින් සමාජය සක්‍රීය කරලීමෙහි ලා සන්නිවේදනය උපයෝගී වන්නේ කෙසේදැයි නිර්වචන ඇසුරෙන් විස්තර කරන්න
2. මානව සන්නිවේදන ක්‍රියාවලියේදී අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය පදනම් වන ආකාරය උදාහරණ ඇසුරෙන් පහදන්න
3. අනන්‍ය සන්නිවේදනයේ විශේෂතා කෙටියෙන් පැහැදිලි කර එය වර්තමාන සන්නිවේදන අවශ්‍යතා සපුරාලීමෙහි ලා උපයෝගී වන ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න
4. සන්නිවේදනය ඵලදායීව සිදු කිරීමේදී විවිධ සන්නිවේදන ස්වරූප යොදා ගනී. තෝරාගත් අවස්ථාවක් ඇසුරෙන් පැහැදිලි කරන්න
5. සන්නිවේදන අධ්‍යයනයන් තුළ විවිධ ප්‍රවේශයන් දක්නට ලැබේ. අලංකාරවාදී, සංඥාර්ථවේදී, සයිබනතික ප්‍රවේශ හා සමාජවිද්‍යාත්මක ප්‍රවේශ පිළිබඳව වෙන වෙනම කරුණු ගෙන හැර දක්වන්න.
6. පුද්ගලාන්තර සන්නිවේදනය තුළ පුද්ගල සම්බන්ධතා ගොඩ නගා ගැනීමේදී සමාජ විනිවිද යාමේ න්‍යායේ (Social Penetration Theory) ඇති වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරන්න
7. ලෝකයේ විවිධ රටවල මාධ්‍ය ව්‍යුහය පිළිබඳව හැදෑරීමේදී අධිපතිවාදී සංකල්පය වෙනුවට සමාජ වගකීම් සංකල්පයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න
8. පහත මාතෘකා අතරින් තෝරා ගත් මාතෘකා හතරකට **(04)** කෙටි සටහන් ලියන්න

   I. HUB ආකෘතිය
   II. සන්නිවේදන බාධක
   III. ප්‍රතිපෝෂණය
   IV. සංදේශය
   V. බලපෑම
   VI. නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය